# ශ්‍රී ලංකේය ජන ගායන ක්ෂේත්‍රයෙහි ඇතුළත් නෙලුම් ගායන ශෛලියේ විශේෂතා පිළිබඳ මානවවංශ සංගීතවිද්‍යාත්මක විමර්ශනයක්


**අයි. එස්. වීරක්කොඩි**
**සංගීතවිද්‍යා අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය**
***isamindani@gmail.com***



ශ්‍රී ලංකාවේ ජන ගායන පිළිබඳ විමසීමේ දී විවිධ ප්‍රදේශානුගත ව, විවිධ ක්ෂේත්‍ර තුළ පවතින ජන ගායන රාශියකි. එම ජනගායන පිළිබඳ වර්ගීකරණ කිහිපයක් මේ වන විට ඉදිරිපත් ව තිබේ. සිංහල ජන සංගීතයෙහි අන්තර්ගත සියලු ම ලක්ෂණ හඳුනාගත හැක්කේ ජන සංගීතයෙහි ඇතුළත් ජන ගායන ක්ෂේත්‍ර තුළිනි. නෙලුම් ගායන ශෛලිය ඉන් එක් ගායන ශෛලියකි. කුඹුරේ වල්පැල නෙලීමේ දී හෝ අලුත් පැල සිටුවීමේ දී හෝ ගයන ගී නෙලුම් ගී ලෙස හැඳින්වේ. සාමූහිකත්වය ප්‍රකට කෙරෙන මෙය ගැමි ජනයා අතර ප්‍රචලිත ගායන ප්‍රකාරයකි.

කෘෂිකාර්මික ජීවනෝපාය කරගත් ගැමි සමාජය තුළ ගොයම් නෙලුම සඳහා කාන්තාවගේ දායකත්වයට ඇත්තේ දීර්ඝ ඉතිහාසයකි. දක්ෂ පළපුරුදු ගායිකාවක මුල පිරූ නෙලුම් ගීයට සෙසු පිරිස ද එක්වීම විශේෂතාවකි. නෙලුම් ගායන ආරම්භ වන්නේ ආශිර්වාද ලබා ගනිමිනි. වල් නෙලීමේ දී මෙන් ම කුරහන්, තලමල, තෙතඟු ගී ආදිය ද නෙලුම් ගායන ශෛලියට ඇතුළත් වේ.

නෙලුම් ගායනාවේ ප්‍රධාන වර්ග දෙකකි. නෙලුම් ඕසය හා නෙලුම් සින්දුව වශයෙනි. ඕස යනු තනුව යන්නට යෙදෙන්නකි. විලම්භ ලයෙන් යුත් ගායන ප්‍රකාරයකි. ඕසේ ගායන රටාවේ විවිධත්වය අනුව පිරිත් ඕසේ, හොරණෑ ඕසේ නමින් වර්ග කිහිපයක් ප්‍රචලිත ව පවතී. නෙලුම හමාර කරන අවස්ථාවේ ගැයෙන ගී නෙලුම් සින්දු මධ්‍ය හා ද්‍රැත ලයෙන් ගැයේ. කණ්ඩායම් වශයෙන් ගායනය කරනු ලබන ජන ගී අතුරින් නෙලුම් ගායන ශෛලියේ විශේෂතා කිහිපයකි. සංවර ව, සංයමයෙන් යුතු ව ගැයීම කැපී පෙනේ. නෙලුම් ගායනාවේ ස්වර සීමාව ඉතා පටු ය. ස්වර තුනක්, හතරකට වඩා ඇසුරු නොකෙරේ. පාරම්පරික නාදමාලාවලින් යුක්ත ය. රිද්මය විවිධාකාරය. ශ්‍රී ලාංකේය ජන ගායන ලක්ෂණ වලින් සමන්විත නෙලුම් ගී පාරම්පරික ගැමි ගී අතර මිහිරි ගායන විශේෂයකි. පිරිත් සජ්ඣායනයේ ආභාසය ද නෙලුම් ගායන සඳහා ලැබී තිබේ. නෙලුම් ගායන ශෛලියේ විශේෂතා මානවවංශ සංගීතවිද්‍යාත්මක ව විග්‍රහ කිරීම මෙහිදී සිදු කෙරේ. ලිඛිත සාහිත්‍ය අධ්‍යයනය මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයනය ද මෙහි පර්යේෂණ ක්‍රමවේදය වේ.



***ප්‍රමුඛ පද:*** *නෙලුම් ගායන ශෛලිය, ජනශ්‍රැතිය, ජන ගී, ජන ගායන ක්ෂේත්‍රය, මානවවංශ සංගීතවිද්‍යාව*